# කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය

## පුරප්පාඩු

පහත දක්වා ඇති තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ මාසික වැටුප් ලබන ස්ථිර සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### *1. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි - පුරප්පාඩු 9*

| පර්යේෂණ අංශ | විෂය පථය |
|---|---|
| 1. ශාක විද්‍යා දෙපාර්තමේන්තුව | - භෝග කායික විද්‍යාව/පටක රෝපණය/ ආතති කළමනාකරණය |
| 2. පාංශු හා ශාක පෝෂ්‍යත්ව දෙපාර්තමේන්තුව | - විශ්ලේෂණ රසායනය/ශෂ්‍ය විද්‍යාව |
| 3. ප්‍රවේණි හා ශාක අභිජනන දෙපාර්තමේන්තුව | - ප්‍රවේණි විද්‍යා, ශාක අභිජනනය සහ අනුක ජීව විද්‍යා |
| 4. දළ රබර් සැකසුම් සංවර්ධන හා රසායනික ඉංජිනේරු දෙපාර්තමේන්තුව | - රසායන විද්‍යාව/රසායනික ඉංජිනේරු |
| 5. බහු අවයවික රසායන දෙපාර්තමේන්තුව | - රසායන විද්‍යාව/බහුඅවයවික තාක්ෂණය |
| 6. රබර් තාක්ෂණික හා සංවර්ධන දෙපාර්තමේන්තුව | - රසායන විද්‍යාව/බහුඅවයවික විද්‍යාව (රබර් තාක්ෂණය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරනු ඇත.) |
| 7. දළ රබර් හා රසායනික විශ්ලේෂණ දෙපාර්තමේන්තුව | - රසායන විද්‍යාව/විශ්ලේෂණ රසායනය |
| 8. ජෛවමිතික අංශය | - ජීවමිතිය සහ සංඛ්‍යානය |
| 9. උපයෝගීතා පර්යේෂණ ඒකකය | - සමාජ ආර්ථික විද්‍යාව |

**සුදුසුකම්**

<u>බාහිර</u> :

අ. අදාල විෂය සංකලනය සහිත පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පළමුවැනි පෙළ හෝ දෙවැනි පෙළ (ඉහළ) සිව් වාර්ෂික (04) විද්‍යාවේදි හෝ කෘෂිකර්ම විශේෂ උපාධිය

හෝ

ආ. අදාල විෂය සංකලනය සහිත පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් දෙවැනි පෙළ (පහළ) සිව් වාර්ෂික (04) විද්‍යාවේදි හෝ කෘෂිකර්ම විශේෂ උපාධිය සමඟ අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ එක් අවුරුදු පශ්චාත් උපාධිය

හෝ

ඇ. අදාල විෂය සංකලනය සහිත විද්‍යාවේදි හෝ කෘෂිකර්ම උපාධිය සමඟ අදාල ක්ෂේත්‍රයේ අවුරුදු දෙකක (02) පශ්චාත් පර්යේෂණ උපාධිය

සමඟ

අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය සමඟ පළමු වැනි උපාධිය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර අටක (08) පර්යේෂණ පළපුරුද්ද.

**සටහන :** ක්ෂේත්‍රයට අදාල ප්‍රකාශන ඉදිරිපත් කිරිම අමතර සුදුසුකමක් වනු ඇත.

**වයස, වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය :**

අවුරුදු 30 ට වඩා අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වඩා වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් හට මෙම වයස් සීමාව අදාල නොවේ.
AR -2 (රු.76,200 – 2000 x 10 – රු.96,200)
ඉහත දක්වා ඇති වැටුපට අමතරව ජිවන වියදම් දීමනාව හා වෘත්තීය දිමනාව ගෙවනු ලැබේ.

**රැකියා විස්තරය :** දෙපාර්තමේන්තු ප්‍රධානී, ප්‍රධාන පර්යේෂණ නිලධාරි, අත්හදාබැලීමේ සහ තාක්ෂණික නිලධාරීන්ගේ අවම මගපෙන්වීම යටතේ පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම, ප්‍රථිඵල විශ්ලේෂණය කිරීම විශේෂිත විෂයන්හි දත්ත ඉදිරිපත් කිරිම, දත්ත රැස්කිරීම සහ වාර්තා කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානී සහ ප්‍රධාන පර්යේෂණ නිලධාරිගේ මගපෙන්වීම යටතේ දෙපාර්තමේන්තුවේ තාක්ෂණ හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරිම ජොෂ්ඨ පර්යේෂණ නිලධාරිගේ වගකිම වේ.

**තේරිමේ ක්‍රමය :** පත්විම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරික්ෂණයක් මගින්

## *2. ජොෂ්ඨ උපදේශක නිලධාරි - පුරප්පාඩු 2*

**සුදුසුකම්**

<u>බාහිර</u> :

අ. අදාල විෂය සංකලනය සහිත පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පළමුවැනි පෙළ හෝ දෙවැනි පෙළ (ඉහළ) සිව් වාර්ෂික (04) විද්‍යාවේදි හෝ කෘෂිකර්ම විශේෂ උපාධිය

හෝ

ආ. අදාල විෂය සංකලනය සහිත පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් දෙවැනි පෙළ (පහළ) සිව් වාර්ෂික (04) විද්‍යාවේදි හෝ කෘෂිකර්ම විශේෂ උපාධිය සමඟ අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ එක් අවුරුදු පශ්චාත් උපාධිය

හෝ

ඇ. අදාල විෂය සංකලනය සහිත විද්‍යාවේදි හෝ කෘෂිකර්ම උපාධිය සමඟ අදාල ක්ෂේත්‍රයේ අවුරුදු දෙකක (02) පශ්චාත් පර්යේෂණ උපාධිය

සමඟ

අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය සමඟ පළමු වැනි උපාධිය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර අටක (08) පර්යේෂණ පළපුරුද්ද.

**සටහන :** ක්ෂේත්‍රයට අදාල ප්‍රකාශන ඉදිරිපත් කිරිම අමතර සුදුසුකමක් වනු ඇත.

**වයස, වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය :**

අවුරුදු 30 ට වඩා අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වඩා වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් හට මෙම වයස් සීමාව අදාල නොවේ.
AR -2 (රු.76,200 – 2000 x 10 – රු.96,200)
ඉහත දක්වා ඇති වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා වෘත්තීය දිමනාව ගෙවනු ලැබේ.

**රැකියා විස්තරය :** දෙපාර්තමේන්තු ප්‍රධානී, ප්‍රධාන උපදේශක නිලධාරි සහ ව්‍යාප්ති නිලධාරීන්ගේ අවම මගපෙන්වීම යටතේ උපදේශන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම, ප්‍රථිඵල විශ්ලේෂණය කිරීම විශේෂිත විෂයන්හි දත්ත ඉදිරිපත් කිරිම, දත්ත රැස්කිරීම සහ වාර්තා කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානී සහ ප්‍රධාන උපදේශක නිලධාරිගේ මගපෙන්වීම යටතේ දෙපාර්තමේන්තුවේ තාක්ෂණ හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරිම ජොෂ්ය උපදේශක නිලධාරිගේ වගකිම වේ.

**තේරිමේ ක්‍රමය :** පත්විම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

3. ***ගිණුම් හා ප්‍රසම්පාදන නිලධාරී - පුරප්පාඩු 2***

**සුදුසුකම්**

<u>**බාහිර**</u> : පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කළමනාකරණ හෝ වාණිජ උපාධිය හෝ ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව

සහ

සැපයුම් හා භාණ්ඩ කළමනාකරණය පිළිබඳ එක් අවුරුදු සහතික පත්‍ර පාඨමාලාවකින් පසු රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික සීමිත සමාගමක (PLC) දේශීය හා විදේශීය සැපයුම් කටයුතු සම්බන්ධව විධායක තනතුරක වසරක (01) සේවා පළපුරුද්ද

**වයස, වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය :**

අවුරුදු 22ට වඩා අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වඩා වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් හට මෙම වයස් සීමාව අදාල නොවේ.
JM 1 -2 (රු.43355 – 10 X 755 – 18 X 1135 - රු.71,335)
ඉහත දක්වා ඇති වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**රැකියා විස්තරය :** ගණකාධිකාරි/ජොෂ්ය ගණකාධිකාරි ගේ අධීක්ෂණය යටතේ භාණ්ඩ හා සේවාවල පිරිවැය, ගුණාත්මකභාවය හා කල්පැවැත්ම සැලකිල්ලට ගනිමින් රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් සියළු භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම ගිණුම් හා ප්‍රසම්පාදන නිලධාරිගේ වගකිම වේ. .

**තේරිමේ ක්‍රමය :** ලිඛිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත (භාෂා නිපුනත්වය/ප්‍රවීණතාවය, අභියෝගතා පරීක්ෂණය තනතුරට අදාල විෂය දැනුම සහ පරිගණක පරීක්ෂණය) පත්විම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**සියළු තනතුරු සඳහා වෙනත් වරප්‍රසාද සහ පොදු කොන්දේසි**

- ♦ ආයතනයේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයේ පවතින නීති රීති ප්‍රකාර වෛද්‍ය ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ.
- ♦ සේවකයා විසින් වැටුපෙන් 10% ක් කාර්යය මණ්ඩල අර්ථ සාධක අරමුදල සඳහා දායක කළ යුතු අතර, ආයතනය විසින් 15% ක දායකත්වයක් සපයනු ලැබේ. සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල වෙනුවෙන් ආයතනය විසින් 3% ක දායකත්වයක් සපයනු ලැබේ.
- ♦ අගලවත්ත කාර්යාලයේ සේවය සඳහා තේරී පත්වන අය සඳහා (ආයතනයේ නීති රීති ප්‍රකාරව හිස්ව තිබේ නම්, කුලී රහිත, ගෘහ භාන්ඩ සහිත නිල නිවාසයක් ලබාගැනීමට හෝ රත්මලාන සිට අගලවත්ත දක්වා ධාවනය කෙරෙන කාර්යාල බස් රථයෙන් (ආයතන) නීති රීති ප්‍රකාරව දිනපතා ගමන් කිරීමේ පහසුකම් ලබා ගත හැක.
- ♦ ශ්‍රී ලංකාවේ ඕනෑම පලාතකට මාරු කළ හැක.

**අයදුම්පත් ක්‍රියාවලිය**

පහත දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුව සකසන ලද අයදුම්පත් **<u>2024.06.12 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ</u>** ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතුය. ලිපි කවරයේ ඉහල වම් කෙළවරෙහි තනතුර සඳහන් කළ යුතු වන අතර, දැනට රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/පුද්ගලික ආයතන වල සේවය කරන අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත අදාල ප්‍රධානින් මගින් ඉදිරිපත් කළ යුතුය.

**පර්යේෂණ නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් කිරීමේදී වෙබ් අඩවියේ සඳහන් පරිදි අදාල පර්යේෂණ අංශය සහ විෂයය පථය සඳහන් කළ යුතුය. තනතුරු කිහිපයකට අයදුම්පත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් එක් එක් පර්යේෂණ අංශ සඳහා විෂයය පථය සඳහන් කරමින් වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය.**

1. සම්පූර්ණ නම, වයස සහ විවාහක අවිවාහක බව
2. අදාල අධ්‍යාපන සහතික සහ උප්පැන්න සහතිකය ඇතුළු වෙනත් සහතික වල සහතික කරන ලද පිටපත් ඇමිණීම අනිවාර්යය වේ.
3. වර්තමාන සහ පසුගිය රැකියාවන් හි රැකියා යෝජකයන්ගේ නම, ලිපිනය සහ රැකියාව වෙනස් කිරීමට හේතු
4. අයදුම්කරුගේ කුසලතාවයන් සහ දැනුම ඇගයීමට හැකි ඥාතීන් නොවන නිර්දේශකවරුන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්

ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරිමට හේතු වේ. කුමන ආකාරයකින් හෝ මේ සම්බන්ධයෙන් අනිසි බලපෑම් කිරීමද නුසුදුසුකමක් වනු ඇත.

අධ්‍යක්ෂ (වැ.බ.)
ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය
ඩාර්ටන්ෆීල්ඩ්
අගලවත්ත.

2024.05.16